**සිංහල භාෂාව හා සාහිත්‍යය තරග 2024(කලාප)**

අපේක්ෂකයාගේ නම- ----------------------------------------------------------------------------------------------------
(මුලකුරු සමග නම)

පාසලේ නම හා ලිපිනය- --------------------------------------------------------------------------------------------
----------------------------------------------------------------------------------------------------------------------------

පාසල් වර්ගය- 200 ට අඩු / 201-500 / 501 ට වැඩි

කොට්ඨාසය- --------------------------------------------------------------------------------------------------------

කලාපය- --------------------------------------------------------------------------------------------------------

සාහිත්‍ය දැනුම මිනුම

10 ශ්‍රේණිය කාලය පැය 03 (මුළු ලකුණු 100)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

(01) පහත දී ඇති ප්‍රකාශ ඇසුරෙන් (අ) කීවේ කවුරුන් විසින් ද? (ආ) කීවේ කා හට ද? (ඉ) කුමන අවස්ථාවේදී ද? (ඊ) උපුටා ගත් පාඩමෙහි නම කුමක් ද ? යන ප්‍රශ්නවලට පිළිවෙලින් පිළිතුරු දක්වන්න.

I **"එව,පින්වත්නි, මියුලු නුවර ගොස් වේදේහ රජ්ජුරුවන්ගේ ඉස තල්පැන් පලක් මඬනා සේ කපා පියා..."**

II "කොල පව්ටු දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති ...අඥාන බමුණු මහල්ල"

III "හොඳයි, කරුණාව වේලිච්ච කුඹුරට වැස්සක් වගෙයි කියනවනේ ! "

IV "අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති.තේ ටිකක් දුන්නොත් නරක ද? "

V "අර ඉන්නෙ එයා නේද? අර දියට මොනවදෝ විසි කරනවා."

**(ලකුණු 4x5 = 20යි)**

**(02) පහත දැක්වෙන පද්‍ය සම්පූර්ණ කරන්න.**

I දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
-----------------------------------------------------
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
-----------------------------------------------------

II වරද පෙනෙන තරමට වැරදුණා නොවේ
වරද ඇතත් නිකරුණේ වැඩ කළා නොවේ
-----------------------------------------------------
-----------------------------------------------------

III -----------------------------------------------------
-----------------------------------------------------
සුන්දර සුරඹුන්ගෙ අතේ
නැළවෙන බව සිතනු පුතේ

IV එවන් ලෙයින් උපන් පුතේ
සුරු විරුකම් ඔබට ඇතේ
-----------------------------------------------
-----------------------------------------------

V සමන් පිච්ච මල් ඉහිරුණු
-----------------------------------------------
වගෙයි අහස අන්න බලනු
-----------------------------------------------

(ලකුණු 4x5 = 20යි)

(03) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I ගුත්තිල කාව්‍ය රචනා කළේ කවුද?--------------------------------------------------------------------

II සතරකන් මන්ත්‍රණය පාඩම උපුටා ගත් ග්‍රන්ථය කුමක්ද? ---------------------------------------------

III උම්මග්ග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක්ද?------------------------------------------------------

IV කෝට්ටේ යුගයේ රචිත ග්‍රන්ථ 03ක් නම් කරන්න.------------------------------------------------------

V ගුත්තිල කාව්‍යය රචනා කිරීමේදී යොදා ගත් විරිත් මොනවාද?-----------------------------------------

VIදැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතිය කුමක් ද?-------------------------------------------------

VII විලේජ් ඉන් ද ජංගල් කෘතිය සිංහල භාෂාවට පරිවර්තනය කළේ කවුද?----------------------------

VIII එම කතුවරයාගේ වෙනත් කෘතියක් නම් කරන්න.---------------------------------------------------

IX විවිධ වෘත්තීන් ඇසුරින් නිර්මාණය වී ඇති ජනකවි වර්ගයක් නම් කරන්න.------------------------

X කොළඹ යුගයට අයත් කවීන් දෙදෙනෙක් නම් කරන්න.---------------------------------------------

(ලකුණු 1x10 = 10යි)

**(04)පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**සම්මා සම්බුදු රජු ගේ**
**සදහම් කිරි රස දිව ගේ**
**සැදු ජාතියකය අන ගේ**
**උපන්නේ නුඹ පුතේ මගේ**

**රටට සිද්ද වුණු විපතේ**
**නිසා ගැමුණු යහන මතේ**
**වකුටුව උන් විදිය හිතේ**
**තියාගන්ට ඕනැ පුතේ**

**ලංකාවට වුණු නින්දා**
**එහෙම පිටින් හළ හින්දා**
**අපෙ ගජබා නර නින්දා**
**ඇඳින ගනින් පුතණුන්දා**

**සිරිසඟබෝ රජු එදිනේ**
**දුගියා හට සිය අතිනේ**
**දුන්නා හිස ගලවමිනේ**
**සාදු කියාපන් පුතුනේ**

**ලංකාවට සෙත දී මේ**
**විදි සැලසූ හැමදා මේ**
**මින්නේරිය දෙවි නාමේ**
**සිතුවොත් වැඩ සෑදේ මේ**

**පැරකුම්බා මහ රජුගේ**
**වෙල් යායෙන් එන සුළඟේ**
**වැදුණු කෙණෙහි මගෙ පුතුගේ**
**යෝද බලය හැදෙයි ඇගේ**

I කවි පන්තියෙන් කියවෙන්නේ **කුමක්** ගැන ද?------------------------------------------------------------------

II කවි පන්තියේ සඳහන් අතීත රජවරුන් කවුරුන්ද?--------------------------------------------------

III පුතුට යෝධ බලය ලැබෙන්නේ කුමක් නිසා ද?----------------------------------------------------

IV රටට සිදු වූ විපත නිසා ගැමුණු කුමාරයා සිටි ආකාරය කවියා දක්වන්නේ කෙසේ ද?-----------------

V කවියා දක්වන හිස දන් දුන් රජු කවුද?-----------------------------------------------------------

**(ලකුණු 2x5 = 10යි)**

**(05) පහත දැක්වෙන පදවල අර්ථය ලියන්න.**

I කුරුබිලියෙන් ------------------------

II හියොවුරු----------------------------

III සෙන්ධවයන්----------------------

IV බිගු දැල් ------------------------

V රුපුනොද ------------------------

VI කුසුමසරා-------------------------

VII මිණි මෙවුල්---------------------

VIII රන්රසේ------------------------

IX ශෛලිය-------------------------

X ශික්ෂණය--------------------------

**(ලකුණු 1x10 = 10යි)**

(06) පහත සඳහන් ගද්‍ය /පද්‍ය පාඨ ලිහිල් බසින් ලියන්න.

I වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුර ඹර වසමින් සිටි රඟ කුම් වැනි
**සුර සෙනගට සුරසුන් පැනවූ වැනි**

II **'මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ මා තවම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන්හයි' සිතා,සැට රියන් උණ දණ්ඩක් ගෙන්වා සරියේ දෙකක් කොට පළා ඇතුළ පිට ගැට හරවා ශුද්ධ කොට නැවත එක් කොට තබා සමින් වසා බඳවා පිට මැටි ගාවා තපස්වීන් ලවා හිමාලයෙන් ගෙන්වූ මැටි හා ඇඹුල බිජු හා ගෙනැ....**

**(ලකුණු 5x2 = 10යි)**

(07)පහත දැක්වෙන ගීතය කියවා එහි ඇතුළත් සමස්ත අදහස ගැන සැලකිල්ල යොමු කොට ඒ පිළිබඳ ඔබේ සිතට නැගෙන සිතුවිලි **වචන 75 පමණ ලියන්න.**

**අන්න බලන් ඉඳිකඩ ළග**
**කොක්කු රැන වගේ ඇවිත්**
**පුංචි එවුන් නුඹ එනකන් පාර බලන්නේ**
**හීන් සැරේ ගිහින් උන්ට එකතු වෙයන්නේ**

පුංචි දුවේ නුඹ යනකොට සුදු පාටින් ඉස්කෝලෙට
පුංචි මගේ අතීතයේ මන් තනිවෙනවා
ලදු දෙණි මැද දෙවැට දිගේ දොළ පාරින් එගොඩ වෙලා
මගේ හිතින් මන් ආයෙත් පාසල් යනවා

එක පුටුවක වාඩි වෙලා එක පැන්සල දෙකට කඩන්
අකුරු කෙරුව කාලය නෑ ආයෙත් එන්නේ
මං නොදුටුව මගෙ ලෝකය කිරුළු පලන් රැජිණ වෙලා
පුංචි දුවේ නුඹ ඒ ලොව ගොඩ නගපන්නේ

(ලකුණු 20)